# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.08.22 පැය 0615 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1627/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - බණ්ඩාරගම පොලිස් වසම.**

2025.08.21 වන දින සවස් කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ බොල්ගොඩ පාලම අසලදී කාර් රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් සිදුකල වෙඩි තැබීමකින් කාර් රථයේ රියදුරු එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ පිංවල, පානදුර ප්‍රදේශයේ පදිංචි හිටපු බන්ධනාගාර නිලධාරියෙකි.**

වෙඩි තැබීම සඳහා ටී56 වගර්යේ ගිනි අවියක් භාවිතා කර ඇති බවට සැක කරන අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා බණ්ඩාරගම පොලීසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.08.21 වන දින දහවල් කාලයේ පයාගල පොලිස් වසමේ කුඩා පයාගල ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් කිලෝ 01 ග්‍රෑම් 175 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පයාගල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 44 ක් වන පයාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පයාගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - නුවරඑළිය පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.**

2025.08.21 වන දින සවස් කාලයේ බගවන්තලාව පොලිස් වසමේ මාඑළිය රක්ෂිත ප්‍රදේශයේදී නුවරඑළිය පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ හා බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් ඒකාබද්ධව වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන්

පස්දෙනෙකු මැණික් ගැරීමට යොදා ගත් උපකරණද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 35 ත් 56 ත් අතර වයස්වල පසුවන බගවන්තලාව සහ නෝර්වූඩ් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ගම්පහ පොලිස් වසම.

2025.08.21 වන දින රාත්‍රී කාලයේ ගම්පහ පොලිස් වසමේ උඩුගම්පොල කොටුගොඩ මාගර්යේ නැදගමුව ප්‍රදේශයේදී උඩුගම්පොල දෙස සිට කොටුගොඩ දෙසට ධාවනය වූ බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ගම්පහ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ කෙහෙල්බද්දර, උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගම්පහ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - ඉඟිණියාගල පොලිස් වසම.

2025.08.21 වන දින රාත්‍රී කාලයේ ඉඟිණියාගල පොලිස් වසමේ ඉඟිණියාගල අම්පාර මාගර්යේ වාවින්න ප්‍රදේශයේදී අම්පාර දෙස සිට ඉඟිණියාගල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා අම්පාර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ බොඩගොල්ල, පරගහකැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඉඟිණියාගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**